# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2509/26 - 2026 ඔක්තෝබර් මස 07 වැනි බදාදා - 2026.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ කොළඹ මහා නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන කොළඹ මහා නගර සභාවේ තෝරා එවා ඇති සභිකයකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කොළඹ මහා නගර සභාව සඳහා තෝරා එවා ඇති සභිකයකු ලෙස පත් වූ ජයකොඩි ආරච්චිගේ දිසුනි කවිෂා පෙරේරා මහත්මිය අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් අංක 3 හි නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූ ද, එම කොළඹ මහා නගර සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඇලෝසියස් වීරක්කොඩි චන්ද්‍රලතා මහත්මිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කොළඹ මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරි පියුමි ආටිගල වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ඇලෝසියස් වීරක්කොඩි චන්ද්‍රලතා මහත්මිය, කොළඹ මහා නගර සභාවට තෝරා එවා ඇති සභිකයකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**පියුමි ආටිගල,**  
තේරීම්භාර නිලධාරි,  
කොළඹ මහා නගර සභාව.

2026 ඔක්තෝබර් මස 07 වැනි දින,  
කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය.

EOG 10 - 0058

1A - PG 8053 — 04 (2026/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*